**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ**
**ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීම**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ උපලේඛනගත විශේෂඥ තනතුරු 16ක පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරීන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව මෙම තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් පත් කිරීමට අදාළව මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත අනුව අයදුම්පත් කැඳවන අතර, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අදාළ සියළු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. එම අයදුම්පත් හා අදාල ලිපි ලේඛන ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2021.11.02 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ විශේෂඥ තනතුරු පුරප්පාඩු පිරවීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ 13, ගැටඹේ
පේරාදෙණිය

03. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව හා ඒවා පවතින ආයතන පිළිබඳ විස්තර පහත දැක්වේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

- ප්‍රධාන පශු ආර්ථික විශේෂඥ (Chief Livestock Economist) - තනතුරු 01
- ප්‍රධාන වසංගතවේදී (Chief Epidemiologist) - තනතුරු 01
- ප්‍රධාන විද්‍යාඥ (Principal Scientist) - තනතුරු 06
- පශු විමර්ශන විශේෂඥ - තනතුරු 01
- ප්‍රධාන එන්නත්වේදී (Chief Volcanologist) - තනතුරු 01
- පශු ව්‍යාප්ති විශේෂඥ (Livestock Extension Specialist) - තනතුරු 01
- පශු ප්‍රජනන විශේෂඥ (Vet. Reproduction Specialist) - තනතුරු 01
- සත්ත්ව අභිජනන විශේෂඥ (Animal Breeding Specialist) - තනතුරු 01
- ප්‍රධාන ශස්‍යවේදී (Chief Agronomist) - තනතුරු 01
- පශු මහජන සෞඛ්‍ය විශේෂඥ (Vet. Public Health Specialist) - තනතුරු 01
- ක්ෂීර ඉංජිනේරු විශේෂඥ (Dairy Engineering Specialist) - තනතුරු 01

* මෙම තනතුරු සඳහා අයදුම්කල හැකි තනතුරු නාමයන් පිළිබඳව ඇමුණුම 01 හි සඳහන් කර ඇත.

04. සපුරා ලිය යුතු පොදු සුදුසුකම්
ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ 1 ශ්‍රේණියේ වසර තුනක (03) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම.

05. ලැබෙන අයදුම්පත් අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට එහි ප්‍රතිඵල අනුව වැඩිම ලකුණු ලබා ගන්නා නිලධාරීන් අදාළ තනතුරු වලට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. අදාළ නිලධාරියා එම තනතුර භාර නොගන්නේ නම් ලකුණු ලබා ගෙන ඇති අනුපිළිවෙලට අනුව ඊළඟට වැඩිම ලකුණු ලබාගත් නිලධාරියා එම තනතුරට පත් කරනු ලැබේ. ලකුණු පටිපාටිය පහත පරිදි වේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන විෂය ක්ෂේත්‍රයන් හා උපරිම ලකුණු ප්‍රමාණය

<table>
<tr><th>ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන්</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨතාවය</td><td>- උපරිම ලකුණු 40<br>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ 1 වන පන්තියේ වසර 03ක සක්‍රීය සේවා කාලය ඉක්මවා සම්පූර්ණ කර ඇති මුළු සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා රා.සේ.කො. සභා චක්‍රලේඛ අංක 1/2019 අනුව ලකුණු ලබා දෙනු ලැබේ.</td></tr>
<tr><td>කුසලතාවය</td><td>- උපරිම ලකුණු 60<br>
කාර්ය සාධන ඇගයුම් (පූර්වාසන්න වසර 05 ක් සඳහා) - ලකුණු 15<br>
- විශිෂ්ඨ - ලකුණු 03<br>
- සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - ලකුණු 02<br>
- සතුටුදායක - ලකුණු 01<br>
ක්ෂේත්‍රයේ උන්නතියට අදාළ ඉදිරිපත් කිරිම (Presentation ) - ලකුණු 10<br>
- ඉදිරිපත් කරන කරුණු - ලකුණු 04<br>
- සැකසුම, නිර්මාණය, ඉදිරිපත් කිරීමේ විලාශය හා කාල කළමනාකරණය - ලකුණු 03<br>
- පරීක්ෂණ මණ්ඩලය යොමු කරන ගැටළු සඳහා දක්වන ප්‍රතිචාරය - ලකුණු 03<br>
තනතුරට අදාළව පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතියට වන දායකත්වය හා අදාළ ක්ෂේත්‍රයේ අත්දැකීම් - ලකුණු 10<br>
- පශු සම්පත් ක්ෂේත්‍රයට ලබා දී ඇති දායකත්වය - ලකුණු 05<br>
(එක් කාර්යයක් සඳහා ලකුණු 01 බැගින් වේ. ආයතන ප්‍රධානියා මගින් ලිඛිතව සනාථ කල යුතුයි.)<br>
- අදාල ක්ෂේත්‍රයේ අත්දැකීම් - ලකුණු 05<br>
(වසරකට ලකුණු 01 බැගින්)<br>
තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අධ්‍යාපන සුදුසුකම් - ලකුණු 05
<table>
<tr><th></th><th>ආචාර්ය උපාධිය (Ph.D)</th><th>පශ්චාත් උපාධි M.Phi/Msc.By Reserch</th><th>පශ්චාත් උපාධි MSc.</th><th>පශ්චාත් උපාධි ඩිප්ලෝමා</th></tr>
<tr><td>ප්‍රධාන ශසායවේදී</td><td>ලකුණු - 05</td><td>ලකුණු - 05</td><td>ලකුණු - 05</td><td>ලකුණු - 02</td></tr>
<tr><td>ප්‍රධාන විද්‍යාඥ</td><td>ලකුණු - 05</td><td>ලකුණු - 03</td><td>ලකුණු - 02</td><td>-</td></tr>
<tr><td>ප්‍රධාන වසංගතවේදී<br>පශු විමර්ශන විශේෂඥ<br>ප්‍රධාන එන්නත්වේදී<br>පශු ප්‍රජනන විශේෂඥ<br>පශු මහජන සෞඛ්‍ය විශේෂඥ<br>ප්‍රධාන පශු ආර්ථික විශේෂඥ<br>පශු ව්‍යාප්ති විශේෂඥ<br>සත්ත්ව අභිජනන විශේෂඥ<br>ක්ෂීර ඉංජිනේරු විශේෂඥ</td><td>ලකුණු - 05</td><td>ලකුණු - 03</td><td>ලකුණු - 02</td><td>ලකුණු - 01</td></tr>
</table>
(නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලබන ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් මෙහිදී ලකුණු ලබා දෙනු ලැබේ.)</td></tr>
</table>

| | |
|---|---|
| | **වෙනත් සුදුසුකම් - ලකුණු 15**<br>- පළාත්, ජාතික හා අන්තර්ජාතිකව ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණ හෝ<br>- ප්‍රශංසා ලිපි (පොදු 230 බී ආකෘතියේ) හෝ<br>- අන්තර්ජාතික හෝ ජාතික වැදගත්කමකින් යුතු ප්‍රකාශන හෝ<br>- අන්තර්ජාතික හෝ ජාතික විද්‍යාත්මක සඟරාවල පලකරනු ලැබූ පත්‍රිකා<br>• Full paper in peer reviewed journals, Book Chapters -3<br>• Extended abstract -2<br>• Abstracts - 1.5<br>• Newsletters /Leaflets etc. - 1<br>(ඉහත එක් එක් අවස්ථා අතුරින් ඕනෑම අවස්ථාවක් සඳහා එක් අවස්ථාවකට ලකුණු 3 බැගින් උපරිම අවස්ථා 05ක් සඳහා මේ සඳහා අදාළ වන ලේඛන ඉදිරිපත් කළ යුතු අතර, ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.)<br><br>**සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන නිපුණතාවය - ලකුණු 05**<br>- නායකත්වය - ලකුණු 02<br>- සන්නිවේදන හැකියාව - ලකුණු 02<br>- පෞරුෂත්වය - ලකුණු 01 |

සැ.යු. බඳවා ගැනීම්/ උසස් කිරීම්/ කාර්යක්ෂමතා කඩඉම සඳහා සපුරාලිය යුතු මූලික සුදුසුකම් සඳහා සලකා නොබැලූ සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

07. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කරගන්නා ලද අයදුම්පත්‍ර හා අදාල වෙනත් ලේඛන වල විධිමත් පරිදි සහතික කරගන්නා ලද පිටපත් ඇතුලත් ගොනුවක් ද සමඟ යොමුකල යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. සේනානායක**
ලේකම්
පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ
කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය